

# විදර්ශන

රවි සිරිවර්ධන

## නොමියෙන සේකර

1976 වසරේ දුරුතු මස 14 වන දා ගම්පහ රදාවානට ඉහළ අහස අඳුරු මුහුණින් ආකූලව පැවතුනි. කියාගත නොහැකි ශෝකාකූල දවසක පෙරනිමිති හාත්පස පරිසරය වෙලාගෙන මුදුන්වන අයුරු දැකගත හැකි විය. කුරුළු ගී ගිලගත් ගහවැල කිසියම් අනපේක්ෂිත නිසලතාවයකට පත්ව තිබුණි. එදා රදාවානට ඉර පත්තුවුනේ වැසි වලාකුළු පොරවාගෙනය.

ඒ සිංහල කවිය යල - මහ දෙකන්නම සරු කළ අපූර්ව කවියෙකුගේ, ගේය පද රචකයෙකුගේ, සිනමාවේදියෙකුගේ අනපේක්ෂිත නික්මයාම සිදුවූ දිනයයි. මහගමසේකර නම් වූ ඒ අපූර්ව මිනිසා සිය ජීවිතයෙන් සමුගෙන දෙතිස් වසක් සපිරෙන මේ කාලය ඔහු අනුසමරණය කිරීම කවියට පෙම්බැඳි අප අත් නොහළ යුතු මිනිස්කමකැයි මම කල්පනා කරමි. එදා රදාවාන පවුලේ සුසාන භූමියේ ඔහු සදහටම නතරකර එන්නට ඔහුට පෙම් බැඳි රසික සහෘදයනට සිදු වුවද ඔහුගේ චින්තන ධාරාව සිංහල කවියේ අනාගත මුහුණුවර කෙබඳු විය යුතුද යන්න පිළිබඳ නව කථිකාවකට අවශ්‍ය නිර්මාණයක්ම සම්පත් සම්භාරයක් එක්තැන්කොට දුන්නේය. අනෙක් පසින් අමරදේව සමඟ එක්ව සිංහල ගීතයේ -කවි ලකුණ" නිමහම් කිරීමටද ඔහු පුරෝගාමී කාර්යභාරයක් ඉටු කළේය.

අනාගත ලෝකය නිවැරදිව දැකිය හැකි ඉසිවර ඇසක් සේකර සතු විය. ඔහු සිය කවි ඇසින් එවකට ඔහු ජීවත් වූ සමාජය මෙන්ම ඉන් දශක කිහිපයකට පසු එළැඹෙන සමාජයද විනිවිද දුටුවේය. මානව සමාජය හා එහි මිනිස් සම්බන්ධතා කවරාකාර වනු ඇද්ද යන්න පිළිබඳ ඔහුගේ නිර්මාණ හරහා ගැඹුරින් සාකච්ඡා විය.

විටෙක සේකර සමාජයේ දුර්වල තැන් තියුණු උපහාසයෙන් නිරූපණය කළේය. තවත් විටෙක අනුකම්පා පෙරදැරිව ඒ දෙස නෙත් යොමු කළේය. ඒ සියලු තන්හිම සමාජය වඩා යහපත් මිනිස් වාසභූමියක් ලෙස නිර්මාණය විය යුතුය යන අපේක්ෂාව සේකරගේ කවි වල මුළු මහත් හරය විය.

-මේක තමයි කන්තෝරුව
මහ රැජිනගෙ කන්තෝරුව
අප ඉපැදුන කන්තෝරුව
අපි මිය යන කන්තෝරුව

වටපිට බලන්නෙමි මම
හති ඇර ඇර
හිනා මූණක්
හිනා මූණක්

මා වාගෙම ඒ ඔක්කොම හති අරිති
මා වාගෙම ඒ කාටත් හිනා නැති

හදවත් නැත
තනතුරු මිස
මිනිසුන් නැත
සී. සී. ඒ ඒ - ජී ඒ
කා. ස. පා. ස. - ජූලි
අංක විසි හත දරන ඡේදයේ
4:ඊ* වගන්තිය............"

(මක්නිසාදයත් කෘතිය පිටුව 25)

නව ගෝලීය ධනවාදය තුළ මිනිස් සම්බන්ධතා වෙනුවට නිර්මාණය වන්නේ වෙළඳ සම්බන්ධතා ජාලයකි. අප යන සුපිරි වෙළඳ සංකීර්ණයේ වෙළඳ සහායිකාව අප සමග සිනා සෙයි. කටපාඩමින් අසන වචන වැලකි. එහි සැබෑ සිනාවක් හෝ සැබෑ වචන නොවේ. එය ඇයගේ -අලවි ශබ්දකෝෂයයි". අධි පාරිභෝගිකවාදී වෙළඳ යාන්ත්‍රනය ඇය නිර්මාණය කොට ඇත්තේ අප සඳහා නොව අපට අලවි කිරීම සඳහාය. කෙළවරක් නැති සසර සේ සේවා ස්ථානය තුළ ජීවිතය දිය කොට අප පාරිභෝගික ජීවිතය මිලට ගනිමු. එහෙත් අපගේ සැබෑ ආධ්‍යාත්මික සන්තෘෂ්ටිය පිරි ප්‍රාර්ථනා ලෝකය මිලට ගත හැකි නොවේ. සේකර එකරුණු සිය කාව්‍ය චාරිකාව හරහා යථාර්ථවාදී දෘෂ්ටියකින් සාකච්ඡා කොට තිබේ. ඔහු හුදු ප්‍රචාරකවාදියෙකු නොවී සංයමයෙන් මුදාහළ පරිකල්පනය අද්විතීය වෙයි.

කවුරුද ඔය මා අදින්නේ
තරඟ බිමට
දිවීම මිස දිනුමක් නැත....

තරඟය දෙස
පසෙකට වී බලා ඉන්න
ආසයි මම
එපා! එපා! මා අදින්න
දුවගෙන යද්දී මුලු ලොවම තරගයකට
උඹට බැරිය
ඔය විදිහට එකම තැනක
තනියම බලා ඉන්ඩ....

දුවපන් ! දුවපන් !
උඹ දිනාවි
උඹ දිනාවි
උඹ දිනාවි...... !

(මක්නිසාදයත් කෘතිය පිටු 74 - 75)

මේ දිවිල්ල මරණයෙන් මිස කෙළවර කරගත හැකිද ? විවිධ අසංතෘප්ත අපේක්ෂා ජාලයක් කරපින්නාගෙන අපි දුවමින් සිටිමු. මේ යාන්ත්‍රීකරණය වූ මානසික ව්‍යාධියෙන් මිදෙන්නට මේ බහු භාණ්ඩික සමාජය අපට ඉඩ දෙතැයි සිතිය හැකිද ?

ශ්‍රී ලාංකික සමාජදේහය මතට බලෙන් ආරෝ පිත 77 විවෘත ආර්ථික ක්‍රමවේදයට පෙර සේකර මිය ගියේය. එහෙත් සේකර අනාගත විපරිනාමය හොඳින් දැන සිටියේයය. මිනිස් වටිනාකම් වෙනුවට මුදල් මූලික වන සමාජයක පෙරනිමිති සේකර මැනවින් පසක්කොටගෙන තිබුණි. ඉන් සමාජයේ ආධ්‍යාත්මයට සිදුවන හානිය සේකර සිය කවි ඇසින් කදිමට නිරූපනය කළේය. සේකර එදා දුටු ඒ සමාජයේ අද අපි වෙසෙමු. ඉන් ගැලවිය නොහැකි ලෙස ආතුරවී සිටිමු. මෙම ව්‍යාධිකාරක ගහන සමාජ අර්බුදය ශ්‍රී ලංකාවට පමණක් උරුම වූවක් නොවේ. එය අද්‍යතන ලෝකය පුරා අඩු වැඩි වශයෙන් ආසාදිතව පවතී. මිනිසා තුළ ජීවත් වූ සංස්කීතික සත්වයා ක්‍රමයෙන් වඳවී යනු පෙනේ. ඔහු වෙළඳ වටිනාකම් වෙත පෙම් බැඳි දැක්මකින් පෝෂණය කර තිබේ. අධ්‍යාත්මික ජීවිතය ඔසවාතබන කලාව සෞන්දර්යය ඔහු වෙතින් ඈත් කෙරෙමින් ඇත. මින් සමාජය මුදා ගන්නා විකල්ප ක්‍රියාවලියක් යනු වෙළඳපොළ ලාභ ඉපැයිය හැකි කටයුත්තක් නොවේ. ඊට අනුග්‍රහයකයින් ඉදිරිපත් වෙතැයි සිතීම දුෂ්කරය.

පසුගිය දිනක මගේ පරපුරේ එක්තරා හිතවතකුගෙන් සේකර පිළිබඳව විමසා සිටියෙමි. ඔහු සේකරගේ නම අසා ඇති නමුත් ඔහු කවරෙකුදැයි නොදැන සිටියේය. එහෙත් ඔහු - සිරස සුපර්ස්ටාලා" ගැන හොඳින් දනිති. ඉදින් ඔහුට දොස් කියා කුමටද. දඩ බල්ලන් සේ මුදල් ඉව කරමින් දුවන සමාජයක මිනිස් ජීවිතයේ සැබෑ අරුත ගැඹුරු පතුලින් අල්ලාගත් මානවකයින් දුලබ වීම අරුමයක් නොවෙතැයි මම සිතමි.

සේකර මුදාහළ උසස් චිනතනයන් කියවීම මෙවන් ලිපියකට ලඝු කළ හැකි වෙතැයි මම කෙසේවත් නොසිතමි. ඊට යම් ප්‍රවේශයක් හෝ ලබා ගත හැකිවීය යන සතුට සිත තුළ තබාගෙන මම නතර වෙමි.

සංක්‍රාන්ති කලි යුගයේ
හෙල්ලුම් කන සමාජයේ
පාලම උඩ
මේ මගේ නෑයාය
මිතුරාය - සැමියාය - බිරින්දෑය
විශ්වාසයක් නොමැත
අන්තෝ ජටා බහී ජටා

(-මක්නිසාදයත් " කෘතිය පිටුව 76)

**රවී සිරිවර්ධන**
ravi.siriwardhana@gmail.com

